අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය - පිරිවෙන් අධ්‍යාපන අංශය
Ministry of Education, Higher Education and Vocational Education - Piriven Education Division
கல்வி, உயர்கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சகம் - பிரிவேனா கல்விப் பிரிவு

# අන්තර් පාරිවේණික සිසු නිපුණතා ඇගයීම - 2025
## දිස්ත්‍රික් වටය

සියලු ම හිමිකම් ඇවිරිණි. All rights reserved. அனைத்து உரிமைகளும் பாதுகாக்கப்பட்டவை.

**ජ්‍යේෂ්ඨ අංශය** | **පාලි භාෂා හා සාහිත්‍යඥානය** | **කාලය පැය - 03 යි.**

## පිළිතුරු පත්‍රය

01.

i. කච්චායන, මොග්ගල්ලාන, සද්දනීති සම්ප්‍රදායන් ය.

ii. තෙ + අජ්ජ , තං + එව

iii. තුම්හෙහි / තුම්හෙහි

iv. වසිට්ඨ + ණ - අපච්චත්ථ තද්ධිතය, පාප + තම - අත්‍යත්ථ තද්ධිතය

v. **තවෙ, තුං, තායෙ** යන ප්‍රත්‍ය යොදා සාදා තිබිය යුතුය.

vi. ප්‍රථම රාජගුරු ධර්මකීර්ති හිමි.

vii. මෝහවිච්ඡේදනී.

viii. අග්ගඤ්ඤ සූත්‍රය.

ix. 08 යි.

x. පඤ්චප්පකරණට්ඨකථා

02. i. මහණෙනි, නැවත අනිකක් ද කියමි. කාමය හේතුකොට, කාමයේ මුල් කරණ කොට, කාමය කරණ කොටගෙන, කාමය නිසා කයින් දුසිරිතෙහි හැසිරෙති. වචනයෙන් දුසිරිතෙහි හැසිරෙති. සිතින් දුසිරිතෙහි හැසිරෙති. ඔවුන් කයෙන් දුසිරිතෙහි හැසිර, වචනයෙන් දුසිරිතෙහි හැසිර, සිතින් දුසිරිතෙහි හැසිර, ශරීරයේ බිඳීමෙන් මරණින් මත්තෙහි සැපයෙන් පහවූ නපුරු ගති ඇති නපුරු කොට වැටීමක් ඇත්තා වූ නිරයේ උපදිති. මහණෙනි, මෙය කාමය හේතුකොටගෙන කාමයේ මුල් කරණ කොට, කාමය කරණ කොටගෙන, කාමය නිසා පරලොව වින්ද යුතු ආදීනව රාශිය දුක් රාශිය වන්නේ ය.

( මජ්ඣිම නිකාය - මහා දුක්ඛක්ඛන්ධ සූත්‍රය)

ii.

(මාර්ග නැමැති) පසුර බඳිනා ලද්දී ය. එතෙර වූයේ පරතෙර ගියේ, සැඩ පහර හික්මවන්නේ ය, (මාර්ග නැමැති) පසුරෙන් ප්‍රයෝජනයක් නැත. එසේ හෙයින් දැන් ඉතින් කැමැත්තෙහි නම් වැස්ස වසින්න යැ යි භාග්‍යවතුන් වහන්සේ වදාළහ.)

මාගේ ගොපලු භාර්යාව කීකරු ය. ලොල්බව නැත්තී ය. බොහෝ කලක් මුළුල්ලෙහි සමග වසන්නී ය. මන වඩන්නී ය. ඇගේ කිසි පාපයක් නො අසමි. දැන් ඉතින් කැමැත්තෙහි නම් වැස්ස වසින්න යැ යි, (ධනිය ගොපල්ලා කීයේ ය.)

"(ධනියය) මාගේ සිත කීකරු ය. මිදුනේ ය. බොහෝ කලක් වඩන ලදී. මොනොවට දමනය කරණ ලදී. මට පවක් නැත්තේ ය. දැන් ඉදින් කැමැත්තෙහි නම් වැස්ස වසින්න යැ යි බුදුහු වදාළහ.)

මම මා සතු බත් වැටුපෙන් රැකෙන්නෙමි. මාගේ දරුවෝ ද එක්ව වසත්. නිරෝග ය. ඔවුන්ගේ ද කිසි පාපයක් නො අසමි. එසේ හෙයින් දැන් ඉතින් කැමැත්තෙහි නම් වැස්ස වසින්න යැ යි, (ධනිය ගොපල්ලා) කීයේ ය.)

03.

i. ඝෝෂ අඝෝෂ වූ සිව්වන දෙවන වර්ගාක්ෂර හෙවත් මහප්‍රාණ අක්ෂර පර කල්හි එම වර්ගයේ තෙවන පළමු අක්ෂර සුදුසු තැන්හි ද්විත්ව වේ.

උ + ඝෝස / ප + සරති /පඨම+ ඣාන/ දු + භික්ඛං

ii. පූර්ව ස්වරය හා පරස්වරය අසමාන වූ කල්හි පරස්වරය විකල්පයෙන් ලොප් වෙයි.

යස්ස + ඉදානි > යස්සදානි, සඤ්ඤා + ඉති > සඤ්ඤාති, ඡායා + ඉව > ඡායාව

iii . ස්වරයක් පසුව ඇති විට පූර්ව පදයේ අග ඇති එකාරයට යකාරයක් ආදේශ වේ.

තෙ + අජ්ජ > ත්‍යජ්ජ , තෙ + අහං > ත්‍යාහං

iv. ස්වරයක් පසුව ඇති විට පූර්ව පදාන්තයේ ධකාරයට සමහර තැනෙක්හි දකාරයක් ආදේශ වී පසුව පරස්වරය දීර්ඝ වේ.

ඉධ + අහං > ඉදාහං / ඉධ + භික්ඛවෙ > ඉදභික්ඛවෙ

v. ව්‍යඤ්ජනාක්ෂරයක් පසුව ඇති විට පූර්ව ස්වරය ඇතැම් තැනක ලොප් වේ. එම ලොප් කළ ස්ථානයට අකාරයක් ආගම් වේ.

සො + සීලවා > සසීලවා / සො + භික්ඛු > සභික්ඛු / ජානෙම + තං > ජනෙමුතං

**(සූත්‍රවලට අදාළ වෙනත් උදාහරණ දී ඇත්නම් ලකුණු ලබා දෙන්න.)**

04. i. සහාදි යෝගය, හේත්වාර්ථය, විභක්ති අර්ථය, (පඨමා, දුතියා, පඤ්චමී, සත්තමී) විකාරාර්ථය, අවයවාර්ථය, විශේෂණාර්ථය, ඉත්ථම්භූතාර්ථය, ක්‍රියා ප්‍රවර්ගාර්ථය, සමානාර්ථය, කාලාර්ථය, පුබ්බ ශබ්ද යෝගය යන ඒවාට උදාහරණ දී ඇත්නම් ලකුණු දෙන්න.

ii. **දුතියා විභක්ත්‍යර්ථ බහුබ්බීහි සමාසය**

ආගතා සමණා යං සො = ආගතසමණො (විහාරො)

පටිපන්නා අද්ධිකා යං තං = පටිපන්නද්ධිකං (මග්ගං)

**තතියා විභක්ත්‍යර්ථ බහුබ්බීහි සමාසය**

ජිතානි ඉන්‍ද්‍රියානි යෙන සො = ජිතින්‍ද්‍රියො (භගවා)

දිට්ඨො ධම්මො යෙන සො = දිට්ඨධම්මො (අරියසාවකො)

**චතුත්ථී විභක්ත්‍යර්ථ බහුබ්බීහි සමාසය**

උපහටො බලි යස්ස සො = උපහටබලි (යක්ඛො)

දින්නො සුඞ්කො යස්ස සො = දින්නසුඞ්කො (රාජා)

**පංචමී විභක්ත්‍යර්ථ බහුබ්බීහි සමාසය**

අපෙතං විඤ්ඤාණං යස්මා සො = අපෙතවිඤ්ඤාණො (මතකායො)

නිග්ගතො අයො යස්මා සො = නිරයො

**ඡට්ඨී විභක්ත්‍යර්ථ බහුබ්බීහි**

ඛීණා ආසවා යස්ස සො = ඛීණාසවො (අරහා)

දසබලානි යස්ස සො = දසබලො (භගවා)

**(ඒ ඒ ප්‍රභේදයට අදාළ වෙනත් උදාහරණ දී ඇත්නම් ලකුණු ලබා දෙන්න.)**

05. i පාරාජිකපාළි, පාචිත්තියපාළි, චුල්ලවග්ගපාළි, මහාවග්ගපාළි, පරිවාරපාළි

සංඝසුට්ඨුතාය - සංඝයාගේ යහපත් බව පිණිස
සංඝඵාසුතාය - සංඝයාගේ පහසුව පිණිස
දුම්මංකූනං පුග්ගලානං නිග්ගහාය - දුස්සීල පුද්ගලයන්ට නිග්‍රහ පිණිස
පෙසලානං භික්ඛූනං ඵාසුවිහාරාය - ශික්ෂාකාමී භික්ෂූන්ගේ පහසු විහරණය පිණිස
දිට්ඨධම්මිකානං ආසවානං සංවරාය - මෙලොව දී පැවතිය හැකි ආශ්‍රවයන්ගේ සංවරය පිණිස
සම්පරායිකානං ආසවානං පටිඝාතාය - පරලොව පැවැත්මට හේතුවන ආශ්‍රවයන් නැසීම පිණිස
අප්පසන්නානං වා පසාදාය - නොපැහැදුන අයගේ පැහැදීම පිණිස
පසන්නානං වා භීයොභාවාය - පැහැදුන අයගේ වැඩි ප්‍රසාදය පිණිස
සද්ධම්මට්ඨිතියාය - සද්ධර්මයේ දිගුකාලීන පැවැත්ම පිණිස
විනයානුග්ගහාය - සාසනික ශික්ෂාවට අනුග්‍රහය පිණිස

ii. පරිමණ්ඩල වග්ගය, උජ්ජග්ඝික වග්ගය, ඛම්භකත වග්ගය, සක්කච්ච වග්ගය, කබල වග්ගය, සුරු සුරු වග්ගය, පාදුකා වග්ගය යන වග්ග ඇසුරෙන් භික්ෂූන් වහන්සේලාගේ දානය වැළඳීම, ගමන් බිමන් යෑම, සිවුරු හැඳ පෙරවීම, පිණ්ඩපාතයේ වැඩම කිරීම, වැසිකිළි කැසිකිළි වත් ආදිය පිළිබඳව තොරතුරු සටහන් කොට ඇත්නම් ලකුණු ලබා දෙන්න.

06. I.

- ❖ හික්කඩුවේ ශ්‍රී සුමංගල හිමිගෙන් හා යාත්‍රාමුල්ලේ ධර්මාරාම හිමියන්ගෙන් වසර අටක දී පාලි ඉගෙනීම.
- ❖ 1878 ධර්ම සංග්‍රහය, 1981 බෞද්ධ ජාතක පොත හා බෞද්ධ සූත්‍ර යන කෘති සම්පාදනය කිරීම.
- ❖ 1881 - 1885 විනය ග්‍රන්ථ : ප්‍රාතිමෝක්ෂය, මහාවග්ගපාළි, චුල්ලවග්ගපාළි ඉංග්‍රීසි බසට නැගීම.
- ❖ 1884 දාඨාවංසය සංස්කරණය කිරීම.

- ❖ මිලින්දපඤ්හය පරිවර්තනය කිරීම.
- ❖ අභිධම්ම සංග්‍රහය ප්‍රතිසංස්කරණය කිරීම.
- ❖ පාලි ග්‍රන්ථ සමිතිය ආරම්භ කිරීම.
- ❖ සියලු පාලි නිකාය ග්‍රන්ථ, අටුවා හා ප්‍රකරණ ග්‍රන්ථ සමගින් සංස්කරණය කිරීම.
- ❖ වෙලුම් 38 කින් යුක්තව සම්පූර්ණ ත්‍රිපිටකය ඉංග්‍රීසියට පරිවර්තනය කිරීම.
- ❖ 1921 විලියම් ස්ටීවන්ගේ සහයෝගයෙන් පාලි ඉංග්‍රීසි ශබ්දකෝෂයේ පළමු කොටස එළිදැක්වීම.
- ❖ පාලි පුද්ගල ශබ්දකෝෂය එළිදැක්වීම.

ii. ථූපවංසය

සඤ්ඤා - පාලි ථූපවංසය. ස්තූපයන්ගේ ඉතිහාසය

නිමිත්ත - රුවන්වැලි මහා සෑය පමුඛ ස්තූප දහයක් පිළිබඳ ඓතිහාසික තොරතුරු ගෙනහැර දැක්වීම

කර්තෘ - පොළොන්නරු යුගයේ විසූ මහා වාචිස්සර සාමි.

ප්‍රමාණය - පරිච්ඡේද 16ක් ඇති බව සාමාන්‍ය පිළිගැනීමයි. එහෙත් ඇතැම් කෘතිවල පරිච්ඡේද සංඛ්‍යාවේ වෙනසක් ඇත.

ප්‍රයෝජන -

- ▪ බුද්ධ චරිතය හා ශාසනික ඉතිහාසය පිළිබඳ තොරතුරු ඇතුළත් වීම.
- ▪ පැරණි ලංකාවේ සමාජ සංස්කෘතිය වටහා ගැනීමට හැකිවීම.
- ▪ ලක්දිව රාජ පරම්පරා පිළිබඳ ඓතිහාසික තොරතුරු දැක්වීම.
- ▪ ස්තූපකරණය හා ස්තූප වන්දනාව පිළිබඳ තොරතුරු ඇතුළත්ව තිබීම.
- ▪ චම්පු කාව්‍යයක් වශයෙන් රචනාවී තිබීම.

දාඨාවංසය

සඤ්ඤා - දාඨාවංසය. දළදා වහන්සේගේ ඉතිහාස කථාව

නිමිත්ත - ලෝකවාසී බෞද්ධයන්ගේ හිත සුව පිණිස බුදුන් වහන්සේගේ දන්තධාතූන් වහන්සේ පිළිබඳ විස්තර කිරීම හා එහි ඉතිහාසය ඉදිරිපත් කිරීමයි.

කර්තෘ - රාජගුරු ධර්මකීර්ති හිමියන් විසින් රචනා කර ඇත.

ප්‍රමාණය - පරිච්ඡේද 05කි. ගථා 415කි

ප්‍රයෝජන -

- ▪ බුද්ධසාසනයේ ඉතිහාසය පිළිබඳ හඳුනාගත හැකිවීම.
- ▪ බෝධිසත්ත්ව චරිතය පිළිබඳ තොරතුරු ඇතුළත් වීම.
- ▪ බුද්ධත්වය ලැබීමේ සිට බුද්ධ පරිනිර්වාණය දක්වා බුද්ධ චරිතය විස්තර කර තිබීම.
- ▪ සර්වඥධාතු බෙදීම පිළිබඳ විස්තර ඇතුළත් වීම.
- ▪ දළදා වහන්සේගේ ප්‍රාතිහාර්ය පෑම් පිළිබඳ තොරතුරු අන්තර්ගත වීම.

- ලංකාවට දළදා වහන්සේ වැඩම කරවීමේ පුවත දක්වා තිබීම.
- ලක්දිව විසූ රජවරුන් දළදා වහන්සේට කළ පූජාවන් පිළිබඳ විස්තර ඇතුළත්වීම.
- දළදාවේ ආරක්ෂාව පිණිස ගත් ක්‍රියා මාර්ග දක්වා තිබීම.

08. i.

- පද දෝෂ 08කි.
- වාක්‍ය දෝෂ 09කි.
- පද වාක්‍ය දෝෂ 06කි.

මුළු කාව්‍ය දෝෂ ප්‍රමාණය 23කි.

පද දෝෂ, වාක්‍ය දෝෂ, පද වාක්‍ය දෝෂ අතරින් එකක් උදාහරණ සහිතව විස්තර කොට ඇත්නම් සම්පූර්ණ ලකුණු ලබා දෙන්න. දෝෂ පමණක් නම් කර සංඛ්‍යාව සහිතවේ නම් ලකුණු 05ක් ලබා දෙන්න.

ii

| ගණය | ගුරු / ලඝු | සුබ /අසුබ ගණ |
|---|---|---|
| මගණය | UUU | **සුබ ගණ** |
| යගණය | -UU | **සුබ ගණ** |
| රගණය | U -U | **අසුබ ගණ** |
| සගණය | - -U | **අසුබ ගණ** |
| තගණය | UU - | **අසුබ ගණ** |
| ජගණය | - U - | **අසුබ ගණ** |
| භගණය | U - - | **සුබ ගණ** |
| නගණය | - - - | **සුබ ගණ** |

* * *